අභ්‍යන්තර චක්‍රලේඛ : 03/2021

මගේ අංකය : PMO/ADM/01/01/02/01

2021 අප්‍රේල් මස 30 දින

**අග්‍රාමාත්‍ය කාර්යාලයේ මාණ්ඩලික නිලධරයන්,**
**අංශ ප්‍රධානීන් හා අනෙකුත් නිලධරයන් වෙත**

**<u>ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැස්වීම්/සාකච්ඡා සඳහා නිලධාරීන් සහභාගිවීම</u>**

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැස්වීම්/සාකච්ඡා සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඒ සම්බන්ධයෙන් අදාළ නොවන නිලධාරීන් ද සහභාගි වන බව නිරීක්ෂණය වී ඇති බැවින් එවැනි තත්වයන් වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව අවධාරණය කරමි.

02. ඒ අනුව රැස්වීම්/සාකච්ඡා සංවිධානය කරන අංශය භාර මාණ්ඩලික නිලධාරියා විසින් ඒ සඳහා සහභාගි වන නිලධාරීන්ගේ නාමලේඛනය රැස්වීම්/සාකච්ඡා පැවැත්වීමට ප්‍රථමයෙන් අග්‍රාමාත්‍ය ආරක්ෂක අංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර එම නාමලේඛනයේ සඳහන් නිලධාරීන් පමණක් රැස්වීම් ශාලාවට ඇතුළත් කර ගත යුතුය.

03. රැස්වීම්/සාකච්ඡා වාර්තාකරණය සඳහා අග්‍රාමාත්‍ය මාධ්‍ය අංශයෙන් සහභාගිවන නිලධාරී ප්‍රමාණය ද සීමා කිරීමට වග බලා ගත යුතු අතර, වීඩියෝ කැමරා ශිල්පියෙකු, ඡායාරූප ශිල්පියෙකු හා වාර්තා සටහන් තබා ගන්නා නිලධාරීන් දෙදෙනෙකු පමණක් අදාළ කාර්යය සඳහා සහභාගි කරවීමට කටයුතු කළ යුතුය.

04. එසේම ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැස්වීම්/සාකච්ඡා සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරීන් සහභාගිවීමේදී විධිමත් ලෙස සුදුසු, සංවරශීලී ඇඳුමකින් සැරසී සිටිය යුතුය.

05. මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස්වලින් පරිබාහිරව කටයුතු කරන නිලධාරීන් සඳහා විනයානුකූලව පියවර ගැනීමට කටයුතු කරන බව වැඩිදුරටත් අවධාරණය කරමි.

06. මෙම චක්‍රලේඛයේ උපදෙස් 2021 මැයි මස 01 දින සිට බලාත්මක වනු ඇත.

**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්
O/C

පිටපත :-

1. අධ්‍යක්ෂ, අග්‍රාමාත්‍ය ආරක්ෂක කොට්ඨාසය - නාමලේඛනය අනුව නිලධාරීන් රැස්වීම් ශාලාව වෙත ඇතුළු කිරීම සඳහා